## කට ඇති පුතුන් සමග, සම දස්කම් පෑ, රුව ඇති, කට ඇති දියණිය

# කුසුමා ගුණවර්ධන





සම්මානිත මහාචාර්ය
කුසුමා කරුණාරත්න

නොබෝ දා කොළඹදී හඳුන්වා දෙනු ලැබූ, 'කුසුමා ගුණවර්ධන් පාර්ලිමේන්තු කතා එකතුව - (1948--1960)' නම් කෘතිය පිළිබඳව කෙටි අදහස් ඉදිරිපත් කිරීමකට මට ද අවස්ථාව ලැබිණ. දොළොස් වසරක් පුරා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේදී ප්‍රබල හඬක් නගමින් සමාජ ප්‍රගමනය උදෙසා ක්‍රියා කළ, දේශපාලන ක්ෂෙත්‍රයේ නොමැකෙන නමක් තැබූ කුසුමා ගුණවර්ධන මැතිනිය වෙනුවෙන් එලෙසට ප්‍රකාශයට පත් කෙරුණ කෘතියට පෙරවදනක් සපයමින් මා පළ කළ අදහසක් ද මෙහිදී යළිත් සටහන් කිරීමට කැමැත්තෙමි. "බොහෝ විට සමාජය තුළ එදා මෙන්ම අදත්, දේශපාලන ක්ෂෙත්‍රයෙහි හෝ වේවා, අන් කවර ක්ෂෙත්‍රයක හෝ වේවා දක්නට ලැබෙන පුරුෂාධිපත්‍යය සමග කාන්තාවගේ නිර්භීත බව කොතරම් දුරට එඩිතර ලෙස කියා පෑවාද යන්න" කුසුමා ගුණවර්ධන පාර්ලිමේන්තුවේදී කළ කථා ඇතුළත් හැන්සාඩ් වාර්තා සනාථ කර ලයි.

ශ්‍රී ලාංකික සංස්කෘතියට අනුව එදා පිළිගැනුණේ 'කට ඇති පුතුන් හා රුව ඇති දියණියන්' යන සංකල්පයයි. ඒ අනුව, කට ඇති පුතුන් චතුර ලෙස කථා කරමින් සමාජ ප්‍රගමනය සඳහා ඉදිරියට පියවර තබද්දී දියණියෝ තම රූමත් කමින් හා ඒ සමගම ඔවුන්ගෙන් අපේක්ෂිත තැන්පත් කමින් එම සමාජ ප්‍රගමනය වෙනුවෙන් තම සොහොයුරන්ට, ස්වාමිවරුන්ට, පියවරුන්ට සහාය විය යුතු වූහ.

සාම්ප්‍රදායික සිංහල සමාජය තුළ පැවති ආකල්පය එය වුවද අද වන විට පුතුන් මෙන්ම දියණියන් ද සමාජයේ පෙරටම ගොස් ඇති බව පැහැදිලි කරුණකි. ඒ අද තත්වයයි. එනමුදු, කුසුමා ගුණවර්ධන මන්ත්‍රීවරිය සිය පවුල් පසුබිමෙන් ලද පන්නරය හා ශක්තියට සිය ශක්‍යතාවන් මුසු කරගනිමින් 1948 ගණන්වල සිටම ශ්‍රී ලාංකික කාන්තාව සතු විශිෂ්ට හැකියාවන් ප්‍රකට කර සිටියාය. ගැහැනු ළමයකුගේ හැසිරීම හා ක්‍රියා කලාපය පිළිබඳව එදා වැඩිහිටියන් දමා තිබූ නීති රීති හා විවිධාකාර තහංචි බිඳ දමමින් අධ්‍යාපන ක්ෂෙත්‍රයේ ද ඉදිරියට යමින් දැනුම ලබාගන්නට යොමු වූ කුසුමා ගුණවර්ධන උපත ලත් තංගල්ල නගරයේ මැදකැටිය ප්‍රදේශයට ඇය දිදුලන තාරකාවක් බවට පත් වන පෙරලකුණු එදා සිටම පහළ වන්නට ඇත. එම ප්‍රදේශයෙහි විසූ ප්‍රසිද්ධ සමාජ සේවකයකු මෙන්ම ගම් ප්‍රධානියකු ද වූ දොන් දාවිත් අමරසිංහ මහතා සහ එම මැතිනිය තමන්ට ලැබුණු බාලම දරුවා ලෙස ඇය පිළිගත්තේ තුටුපහටු සිතිනි. සාමාන්‍යයෙන් ගැහැනු ළමයකුට යෙදෙන නමකට වඩා වෙනසකින් යුතු නමක් ලෙස, 'කුසුමසිරි' යනුවෙන් තම දියණියට නම් තැබූ දෙමාපියන් ඇය වෙනුවෙන් තැබූ බලාපොරොත්තු, ඔවුන් සිතුවාටත් වඩා ඉහළින් සාක්ෂාත් වන බව එකල දැන නොසිටියා විය හැකිය.

මෙතුමිය පාර්ලිමේන්තුව තුළ ද නිල වශයෙන් හඳුන්වනු ලැබුවේ කුසුමසිරි ගුණවර්ධන, අවිස්සාවේල්ල මන්ත්‍රීවරිය යන නමින් වුවද, වඩා පහසුවටත්, ඇය කෙරෙහි දැක්වූ ගෞරවයටත් ඇය වඩාත් හොඳින් හඳුනාගනු ලැබුවේ කුසුමා ගුණවර්ධන නමිනි. අප බාල වියේදී එතුමිය දේශපාලන ක්ෂෙත්‍රයේ පළ කළ දක්ෂතා ගැන සතුටට පත් වූ අතර කුඩා දැරියක ලෙස මා හට එහි විශේෂත්වයක් ද විය. එනම්, මගේ පියාණන් මට දුන් නමත් එතුමියගේ පියා ඊට වඩා තරමක් විස්තීර්ණ නමක් දුන්නද පසුව ඇය හැඳින්වීමට ලක් වූ කුසුමා යන නමත් දෙක අතර ඇති සාම්‍යය ගැන සිතා යටි සිතෙහි පහළ වූ කිසියම් ළෙන්ගතු බවක් හා ගෞරවයක් මා තුළ ඇය කෙරෙහි ඇති වීමයි.

විශේෂයෙන්ම වර්තමාන ශ්‍රී ලංකාව තුළ දේශපාලන ක්ෂෙත්‍රයට එළඹීමට කාන්තාවන් වැඩි වශයෙන් යොමු නොවීමට විවිධ හේතු ඇත. පවුල නමැති ඒකකය තුළ ගැහැනියක විසින් ඉටු කරනු ලැබිය යුතු කාර්යභාරය අති විශාල මෙන්ම අතිශය සංකීර්ණ ද වෙයි. එවන් යුතුකම් සමූහයක් ඉටු කරන්නට දේශපාලන ක්ෂෙත්‍රයෙහි ක්‍රියාකාරී කාන්තාවකට කොතරම් ඉඩකඩ සැලසේද යන ප්‍රශ්නය අපේ කාන්තාවගේ සිත තුළට නියත වශයෙන්ම නැගෙන්නක් විය හැකිය. ඊට අමතරව, කුසුමා ගුණවර්ධන මැතිනිය දේශපාලනයෙහි නිරතව සිටි එදා තත්වය සමග සැසඳීමේදී අද ශ්‍රී ලංකාව තුළ දේශපාලන ක්ෂෙත්‍රයෙහි උද්ගත වී පවතින ප්‍රචණ්ඩකාරී ස්වරූපයට කාන්තාවන්ට කොතරම් දුරට ඔරොත්තු දිය හැකිද යන්න අනෙක් බාධකය වන්නට පුළුවන. කෙසේ නමුදු ස්ත්‍රී-පුරුෂ භාවයේ සමානත්වයක් වත්මන් ශ්‍රී ලංකාව තුළ පවතී යයි අප එක් අතකින් සිතා සතුටු වන කරුණක් වුවද, බොහෝ අවස්ථාවලදී ඊට ප්‍රතිවිරුද්ධ මානසික තත්වයන් හා ආකල්ප මතු වී ඒම ද නොවැළැක්විය හැකිය. සිය පියාණන්ගේ හැඩි දැඩි ආධිපත්‍යය තම බාල වියේදී දකින දරුවා තමන් ස්වාමිපුරුෂයකු, පියකු වූ පසුව එම ආකල්පවලින් මුළුමනින්ම මිදී කටයුතු කිරීමට අසමත් වනු ඇත. මේ නයින් බලන කල ශ්‍රී ලාංකික සමාජය තුළ ගැහැනිය කෙරෙහි සාධාරණව සිතන හා සලකන පුරුෂ පක්ෂයක් දැකගත හැකි අවස්ථා කොතෙකුත් ඇතත් එසේ නොවන අවස්ථා ද එමටය. කුසුමා ගුණවර්ධන මැතිනිය ජීවත් වූයේත්, දේශපාලන ක්ෂෙත්‍රයෙහි ක්‍රියාකාරී මන්ත්‍රීවරියක් ලෙස කටයුතු කළේත් මේ දැක්වූ දෙවැදෑරුම් ස්වභාවයන් අඩු-වැඩි වශයෙන් පැවති සමාජයක් තුළය. එවැනි පසුබිමක සිටිමින් ඇය රට වෙනුවෙන්, ජනතාව වෙනුවෙන් අවංක මෙහෙවරක් කරන්නට පාර්ලිමේන්තුව තුළදී නැගූ හඬ සැබවින්ම කාන්තාවන්ට ආදර්ශයක් බව කිව යුතුය.

වසර 1948 සිට 1960 දක්වා කාලය තුළදී ඇය පාර්ලිමේන්තු සභාවාරයන්හිදී නිහඬ චරිතයක් නොවූවාය. ඇය එහිදී කළ කථා, නැගූ ප්‍රශ්න හා කළ වාද විවාද ඇතුළත් හැන්සාඩ් වාර්තා එකතු කොට ප්‍රකාශයට පත් කර තිබෙන මෙම ග්‍රන්ථය එදා ඇය නැගූ හඬෙහි අන්තර්ගත වූ අවංක සේවයක අවශ්‍යතාව පිළිබිඹු කරන්නකි. රට තුළ විසූ අහිංසක දුප්පත් ජනතාව පිළිබඳව සැබෑ අනුකම්පාවක්, දයාවක් සහිත සිතකින් ඇය තම හඬ පාර්ලිමේන්තුව තුළ මුදා හළ බවට සාක්ෂි කොතෙකුත් මෙම කෘතිය ඇතුළත දැකගත හැකිය. ඇය වරක් කළ ප්‍රබල ඉල්ලීමකට අනුව, " ආරෝග්‍යශාලාව යනු, කනත්තට යන්න ඉස්සර ඇතුළු වීමේ තැනක් නොවීමට නම් ඒවායේ ඉඩ මදිකම, බෙහෙත් හිඟකම, අපිරිසිදුකම ආදී සියල්ලම ඉක්මනින් සලකා බැලිය යුතුය." (පාර්ලිමේන්තු විවාද, 1948-1960) යනාදී යෝජනාවලින් මන්ත්‍රී ධුරයක් දැරූ කාන්තාවක ලෙස ඇය නැගූ ප්‍රබල හඬ ඉස්මතු වී පෙනෙයි.





පුරුෂ පක්ෂයේ සභිකයන් විශාල සංඛ්‍යාවකට මැදි වී අසුන් ගෙන සිටිමින් කු-සුමා ගුණවර්ධන මහත්මිය පාර්ලිමේන්තුව තුළදී පෑ, චතුර කථිකත්වයත්, විවාදශීලී මෙන්ම තර්කානුකූල වූ ද කතා බහත් මේ වන විට ග්‍රන්ථයක් වශයෙන් පාඨකයන් අතට පත් වී තිබීම වැදගත් කරුණකි. එම කතා හා වාද විවාද මගින් ඇය ප්‍රකට කර ඇත්තේ රට තුළ දුක් විඳින, අසාධාරණයට ලක් වන, අහිංසක දුගී ජනතාව කෙරෙහි තමා තුළ වූ අනුකම්පාවයි. දේශපාලනයට පිවිසෙන ඇතැමුන්, සමහර විට බොහෝ දෙනා දුප්පත් ජනතාව වෙනුවෙන් හඬක් නගන්නේ හුදෙක් ඔවුන් ගැන අවංකවම තමන්ට දැනෙන වේදනාව නිසාද, එසේ නැතහොත් දේශපාලන පක්ෂ අතර ඇති ගැටීම් ආදිය ද ඒවාට මුල් වේද යන ප්‍රශ්නය අද මෙන්ම එදා තත්වය පිළිබඳව ද කෙනකුට මතු කර ලිය හැකි ප්‍රශ්නයකි. විපක්ෂයක සිටිමින් මෙවැනි ප්‍රශ්න ඉදිරිපත් කරන විට, ජනතාව කෙරෙහි තම හද තුළ ඇති සැබෑ අනුකම්පාව ඉස්මතු වෙද්දීම රජයට චෝදනා නැගීමේ අවශ්‍යතාව ද එහි පසෙකින් අන්තර්ගත වේද යන්න කෙනකුට නැගිය හැකි ප්‍රශ්නයකි. ඒ කෙසේ වුවද මෙතුමිය රටේ අසරණ තත්වයට පත් වන ජනතාව වෙනුවෙන් එදා පාර්ලිමේන්තුවේදී ගෙන ආ තර්ක විතර්ක සැබවින්ම එම ජනතාව කෙරෙහි දයානුකම්පාවකින් ද යුතුව කළ ඒවා බවට සැක නැත.

"ගරු කතානායකතුමනි, ගංවතුරෙන් යට වන ප්‍රදේශවල සිටින ජනතාවට උස් පෙදෙස්වලින් ඉඩම් දෙන්නේ ඒ ජනතාව ගංවතුරට යට වී මැරුණායින් පසුව ද, දිව්‍ය ලෝකයට ගියායින් පසුව ද, නිවන් දැක්කායින් පසුව ද යන්න අසනු කැමැත්තෙමි......" (කුසුමා ගුණවර්ධන පාර්ලිමේන්තු කතා එකතුව 1948-1960, 59 පිට) මෙවන් උපහාසාත්මක වේදනාවලින් අසන්නන්ගේ සිත් තුළ ඇති විය හැකි කෝපය හෝ අකැමැත්ත අවම කරවන සේ ඇය යොදාගත් යෙදුම් මගින් ඇය තුළ වූ තීක්ෂණ බුද්ධිය මෙන්ම නිර්මාණාත්මක හැකියාව ද ප්‍රකට වෙයි. දේශපාලනමය වශයෙන් කවර විරෝධතා පැවතියද ඇය මෙසේ හඬ නගා ඇත්තේ එදා පමණක් නොව අද පවා ශ්‍රී ලංකාව තුළ ඇතැම් පිරිස් මුහුණ දෙන දුක්ඛිත ඉරණමක් ගැන සිත තුළ පහළ වූ වේදනාවකිනි, අනුකම්පාවකිනි.

ඇය තම ප්‍රශ්න හා චෝදනා නැගීමට යොදාගත් බස් වහර උපමා ආදී යෙදුම් ද ඇයගේ චතුර කථිකත්වයට මෙන්ම සැබෑ සිත් වේදනාව ද පළ කිරීමට සමත් වී ඇත. පුරුෂ පක්ෂයේ අය බහුතරයක්ම සිටි මෙවන් උත්තරීතර සභාවක මෙතරම් නිර්භීත ලෙස ඇය කථා කළේ තමන් තුළ සහජයෙන්ම ඇතිව තිබූ ශක්තිය හා ආත්ම විශ්වාසය ද පළ කරමිනි.

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව තුළ පළමුවෙන්ම සිංහලෙන් කථා කළ මන්ත්‍රීවරිය බව කියවෙන මෙතුමියට සිය අදහස් ඉංග්‍රීසියෙන් මෙන්ම සිංහලෙන් ද නොඅඩුව ප්‍රකට කර ලන්නට සමත් කමක් තිබීම ද කාන්තාවන් ලෙස අපට ද සතුටු විය හැකි කරුණකි.

ඇය මතු කළ ඇතැම් ප්‍රශ්නවලදී ඇමතිවරුන් සිනාසීම වුවද ඇය ද්වේශයෙන් තොරව, තරමක් ආවේගශීලී ස්වරයකින් ඊට ප්‍රතිචාර දැක් වූ අවස්ථා බොහෝය. "මට පෙනෙන හැටියට ඇමතිවරුන්ට නම් මෙය සිනහ වීමට පුළුවන් ප්‍රශ්නයක් වෙන්න ඇති. එහෙත් ගංවතුරට යට වන ජනතාවට නම් හිනා වෙන්න බැහැ; ගංවතුර නිසා දුක් විඳින තම කොට්ඨාසයේ ජනතාව ගැන මුදල් ඇමතිවරයා ගණනකට වත් ගත්තේ නැහැ. මේ ප්‍රශ්නය මතු වූ විට හිනහ වූවාට මදි ප්‍රශ්නය ගැන කල්පනා කර බලා එය විසඳීමට ක්‍රියා මාර්ග සම්පාදනයක් කළ යුතුය." (59 පිට) මෙබඳු අවස්ථාවලදී ඇය මතු කළ අදහස්වලට හෝ, ඇය කාන්තාවක ලෙසින් එසේ කථා කිරීම ගැන යටි සිතින් වුව සමච්චලයෙන් යුතුව සිතා හෝ ඇමතිවරුන්ට සිනා පහළ වූයේ නම් එහි ප්‍රතිඵලය වූයේ ද කර්කශ භාවය තරමක් යටපත් කරගනිමින්, සංයමයෙන් යුතුව මෙලෙසින් ඇය සිය ප්‍රතිචාරය ද යළි දැක්වීමයි.

උගත්කම, බුද්ධිමත් බව මෙන්ම ආත්ම විශ්වාසය ද එකතුව, සමාජ මෙහෙවරක් උදෙසා අවංක අපේක්ෂාව ද සහිතව කුසුමා ගුණවර්ධන මන්ත්‍රීවරිය වසර දොළහක් පුරා පාර්ලිමේන්තුව ප්‍රාණවත් කරමින් මෙසේ හඬ නැගූ බව සිහිපත් කරන විට ශ්‍රී ලාංකික වනිතාවන්ගේ සිත් තුළ ඇය කෙරෙහි කිසියම් ප්‍රසාදයක් හා ගෞරවයක් ඇති වන බව පිළිගත හැක්කකි. මෙම දොළොස් වසර පුරාම ඇය අඛණ්ඩව ගෙන ගිය මෙවන් වාග් ප්‍රහාර පාර්ලිමේන්තුවේ අසුන් ගෙන සිටි මැති ඇමතිවරුන්ගේ ප්‍රසාදයටත් අප්‍රසාදයටත් කොතෙකුත් භාජන වන්නට ඇති බව ද සිතාගත හැකිය.

ශ්‍රී ලාංකික සමාජය තුළ කාන්තාව ඉදිරියට ඒම සතුටු සිතින් විඳගනිමින් එම තත්වය අගය කරන පුරුෂ පක්ෂයේ ඇත්තන් කොතෙකුත් සිටිය හැකිය. එලෙසටම ඒ ගැන මතු පිටින් කියමින් හෝ රහසේම සිතැඟි මගින් පවසමින් ඊට විරුද්ධතා දක්වන, අප්‍රසාදය පළ කරන, ඔවුන් හෙළා දකින අය ද ඕනෑ තරම් සිටින්නට පුළුවන. සාමාන්‍යයෙන් කවර හෝ ආයතනයක නැතහොත් කාර්යාලයක තමන් අතින් සිදු වන කර්තව්‍යයන්ට වඩා ඉහළින්, නැතහොත් වඩා සාර්ථක අයුරින් කාන්තාවක අතින් යම් මෙහෙවරක් ඉටු වනු දැකීමට අකැමැති පුරුෂයන් විරල නොවන බව ද වත්මන්, සමාජයෙන් වුව ලබන අත්දැකීම්වලින් අපි දකිමු. කුසුමා ගුණවර්ධන මන්ත්‍රීවරිය පාර්ලිමේන්තුව තුළදී එක දිගටම, ආණ්ඩු පක්ෂයේ ඇමතිවරුන් දෙසට එල්ල කළ විවේචන අප්‍රමාණය.

"මේ වෙළෙඳ ඇමතිවරයා මගේ පළාතට ගොස් පුවක්පිටියේදී කියන්න යෙදුණා, "චීනයේදී මා බොහෝම ලැජ්ජා වුණා කියා. වෙළෙඳ ඇමතිවරයා චීනයට ගිය අවස්ථාවේදී එහි ගොවීන් ගොවිතැන් කෙරෙහි දක්වන උනන්දුව දැකීමෙන්, ආහාර ප්‍රශ්නය විසඳී තිබෙන හැටි දැකීමෙන් ඔහුට ලැජ්ජා හිතුණාලු! චීනයේ දියුණුව දැක එසේ ලැජ්ජා හිතුණා නම්, මේ වෙළෙඳ ඇමතිවරයා සහ අනෙක් ඇමතිවරුන් එක්කාසු වී මේ ප්‍රශ්නය විසඳන ලෙසයි, මා ඉල්ලා සිටින්නේ ......" මෙතුමිය රජයේ එවකට සිටි මැති ඇමතිවරුන්ට මෙසේ ප්‍රබල ලෙස චෝදනා නගමින්, ඉටුවිය යුතු සේවය මේ යයි පෙන්වා දෙමින් ඒවා ඉටු කළ යුතුයයි බලයෙන් මෙන් පවසමින් නැගූ හඬ පෙර සඳහන් කළ පරිදි බොහෝ මැති ඇමතිවරුන්ගේ යටි සිතේ හෝ අසතුටක් දැනවූවාට සැකයක් නැත. එසේ වුවද, තමන් මන්ත්‍රීවරියක් ලෙස පාර්ලිමේන්තුවේ සිටිමින්, රට තුළ උද්ගතව ඇති ප්‍රශ්න, මහජනතාව විඳින